# අලි පැංචා



B.V.Senuli Thisansa Miheli Gonawala

# අලි පැංචා

B.V.Senuli Thisansa Miheli Gonawala

පළමු දිගහැරීම

Mahamaya girls college, Kandy
Grade 4

ISBN - 975-624-208-971-3

# පිදුම

මල් කැකුළු පුදින ලෙසින්
පින්වර උදේ සුදු වැලි තලාවේ

මා පැමිණි දුර බොහෝ අමිලයි
නුවන වඩනා තක්සලාවේ

දකිනු රිසියෙන් ඇදුරු
සිත් සනසනා මුව අග පිරි
සිනාවේ
පුදමි මේ ගුරු පඬුරු ශිල්පය
මිටට කැටි කරමින්

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10


# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි


ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10


එකෝමත් එක රටක හිටියා අලි පවුලක්.
අලි අම්මා,තාත්තා සහ අලි පැංචා.
එයා හරිම මුරන්ඩුයි.
එයාට අම්මා හා තාත්තා අදරේට
කියන්නේ පැංචා කියලා



දවසක් අලි පැංචා කාටවත් නොකියා කැලයට ගියා.අලි පැංචා ලස්සන කැලය අගය කරමින් ඈතට ඈතට ගියා අලි පැටියා දැක්කා මිදි,ස්ට්‍රෝබෙරි,දං




අලි පැංචා තව ටික දුරක් ඇවිදගෙන
යද්දී දැක්කා පුංචි කුරුල්ලෙක්
තුවාල වෙලා ඉන්නවා
අලි පැංචා දැක්කා පුංචි වැවක්



කුරුලු පැංචා මම ඔයාට උදවු කරන්නම්
ඔහොම ඉන්නකෝ මම අර වැවෙන්
වතුර අරන් ඔයාට වතුර ගෙනත්
දෙන්නම්. අලි පැංචා වැවට ගිහින්
වතුර දාලා කුරුලු පැංචාට
බෙහෙත් දැම්මා.



කුරුළු පැංචා අලි පැංචාට ස්තූති කරලා යන්න ගියා. අලි පැංචා තවත් ඉස්සරහට ගියා. අලි පැංචා තවත් ඉස්සරහට ඇවිදගෙන යද්දී හාවො තුන්දෙනෙක් රණ්ඩු වෙනවා දැක්කා  ඔය ඇපල් ගෙඩිය මගෙ නෑ මගෙ




හැමෝම නිශ්ෂබ්ද වෙන්න ඇයි ඔයාලා
රණ්ඩු වෙන්නේ පලවෙනියට මේ
ඇපල් ගෙඩිය ගත්තේ මම නෑ මම මේ
දෙන්නා නෙවෙයි මම
ඉන්නකෝ මම ඕක තුනට බෙදලා
දෙන්නම් ආ



ස්තූතියි ස්තූතියි ස්තූතියි හා හා
අලි පැංචා එතනින් තව දුරක් ඇවිදගෙන
යද්දී දැක්ක දේට පුදුම වුණා ගහක
රත්තරන් ඇපල් ගෙඩියක් ඈ මේක නම්
පුදුමයක්



අලි පැංචා එක ගෙඩියක් කෑවට පස්සේ අමුතු දෙයක් සිදු වුණා එක පාරටම ඇපල් ගෙඩිය කතා කරන්න පටන් ගත්තා. අලි පැංචා ඔයාට පස්සෙ වෙන්නේ යහපතක් නෙවෙයි අයහපතක් එහෙම කියලා ඇපල් ගෙඩියේ කතා කරන එක නැවතෙන්න පටන් ගත්තා අලි පැංචාට මොකුත් තේරුණේ නෑ අලි පැංචා ඇපල් ගෙඩිය බිමට දාලා එතනින් යන්න ගියා.




තව ටික දුරක් ඇවිදගෙන යද්දි
අලි පැංචා දැක්කා පොකුණක් අලි පැංචාට
ඒකේ නාන්න හිතුණා. අලි පැංචා
පොකුණට බැස්සා විතරයි අලි පැංචා
එරුණා අලි පැංචා හොඳටම බයවෙලා
කෑ ගහනවා



අලි අම්මයි අලි තාත්තයි දුවගෙන
එතනට ඇවිත් අලි පැංචාව බේරා ගත්තා
ඇයි පැංචා අපිට කියන් නැතුව ගියෙ
අපි ඔයාව හැම තැනම හෙව්වා..

සමාවෙන්න අම්මේ මම ආය මේ වැරැද්ද
කරන්නේ නෑ ඊට පස්සේ ඒ ගොල්ල සතුටින්
ජීවත් වුණා.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)